**උහන ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

---

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 27 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 23 දින ද විගණනයට ඉදිරිපත්කර තිබූ අතර 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 06 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට උහන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අත්තිකාරම් ලේඛනයට අනුව 2016 දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් ශේෂය රු.33,049 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) කලින් ලද වරිපනම් ගිණුමේ ආරම්භක ශේෂයන් නොමැතිව කලින් ලද වටිනාකම් ලෙස රු.32,871 ක් වරිපනම් ආදායමට ගැනීම නිසා මෙහෙයුම් ලාභය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) තැන්පත් ලේඛනයට අනුව ගෙවිය යුතු කඩ කාමර තැන්පත් ශේෂය රු.1,620,000 ක් වුවද, එය රු.1,185,000 ක් ලෙස රු.435,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) කර්මාන්ත තැන්පත් සඳහා ලැබිය යුතු රු.2,950,000 ක මුදල් වර්ෂයේදී ලැබී නොතිබුණ ද ආදායම් වෙනුවෙන් තැන්පත් ලෙස ජංගම වගකීම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඉ) 2015 වර්ෂයේදී ආධාර වශයෙන් පුස්තකාලයට ලැබුණු රු.292,835 ක් වටිනා පොත් 836 ක් ගිණුම්ගත නොකිරීම නිසා ස්ථාවර වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.3.2 නීති,රීති,රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති සහ රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ප්‍රාදේශීය සභා රීති 180 | ප්‍රාදේශීය සභාවේ ආදායම් එකතු කිරීම, ගබඩා පාලනය, චෙක්පත් නිකුත් කිරීමට අදාල නිලධාරීන් විසින් ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. |

(ආ) මුදල් රෙගුලාසි 1646 සභාව සතු වාහන 24 ක් සඳහා මාසික ගමන් පිළිබඳ සාරාංශයක් සමඟ මාසයේ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.141,902 ක පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදමක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,795,624 ක් වූ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදමක් බැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,653,722 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පුනරාවර්තන ආදායම් විග්‍රහයේ දී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වරිපනම් හා බදු, කුලී ආදායම් හා බලපත්‍ර ගාස්තු යන මූලාශ්‍ර සියයට 29 සිට සියයට 43 දක්වා පරාසයක වර්ධනයක් ද, සේවා සඳහා ගාස්තු, දඩ හා වරෙන්තු ගාස්තු හා වෙනත් ආදායම් යන මූලාශ්‍රවල සියයට 05 සිට සියයට 32 දක්වා පරාසයක අඩුවීමක් ද පෙන්නුම් කරයි.

පුනරාවර්තන වියදම් විග්‍රහයේ දී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ගමන් වියදම්, සැපයුම් හා උපකරණ, ප්‍රවාහන සම්බන්ධතා හා ආධාර මුදල් මූලාශ්‍රවල සියයට 08 සිට සියයට 46 දක්වා පරාසයක වර්ධනයක් ද, වැටුප් හා දීමනා,ඉන්ධන, වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව හා විශ්‍රාම වැටුප් යන වියදම් මූලාශ්‍රවල සියයට 06 සිට සියයට 43 දක්වා පරාසයක අඩුවීමක් ද පෙන්නුම් කරයි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම් | 2016 වර්ෂයේ තථ්‍ය ආදායම් | 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,229,876 | 1,419,644 | 3,375,198 |
| කුලී ආදායම් | 4,703,148 | 4,421,853 | 245,244 |
| බලපත්‍ර ගාස්තු | 955,000 | 808,575 | - |
| සේවා සඳහා ගාස්තු | 325,000 | 277,750 | - |
| දඩ හා වරෙන්තු ගාස්තු | 2,160,000 | 1,567,363 | 552,666 |
| වෙනත් ආදායම් | 1,925,000 | 970,340 | - |

**2.3.2 වරිපනම් හා බදු**

----------------

සභාව විසින් අවසන් වරට වරිපනම් තක්සේරුව සිදු කර තිබූ 2007 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයට ද වරිපනම් අයකිරීම සිදුකර තිබුණි.

හිඟ හිටි වරිපනම් ලේඛනය අනුව 2016 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් රු.3,375,198 ක් වූ අතර, එම මුදල් අයකර ගැනීම සඳහා සභාව ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

**2.3.3 වෙනත් ආදායම්**

-----------------

සභා බල ප්‍රදේශයේ දුරකථන කුළුණු 12 ක් පැවතිය ද, ඒ සඳහා 2009 අප්‍රේල් 19 දිනැති අංක 1597/8 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව දුරකථන කුළුණු සඳහා අවම වශයෙන් එක් කුළුණකට රු.20,000 ක් බැගින් රු.240,000 ක මූලික ගාස්තුවක් අයකල යුතු වූවත්, එම ගාස්තුව අයකර නොතිබුණි.

**2.3.4 මුද්දර ගාස්තු**

------------

රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් මුද්දර ගාස්තුව වශයෙන් රු.1,416,132 ක් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

සභාවේ සේවය කර ස්ථාන මාරුවීම් ලැබූ සේවකයන් 12 දෙනෙකුගේ සහ විශ්‍රාම ගිය සේවකයකුගෙන් සමාලෝචිත වර්ෂය ආරම්භයේ සිට අයවිය යුතු රු.61,988 ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

------------------------

උහන ප්‍රාදේශීය සභාව විසින් 2015 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද ගමින් ගමට දොරින් දොරට ගම් 15000 ක් නඟා සිටුවීමේ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු.1,000,000 බැගින් මාර්ග 17 ක් කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අදාල ලිපිගොනු හා අනිකුත් තොරතුරු විගණනයට ලබාදෙන ලෙස ප්‍රාදේශීය සභාවට දැනුම් දුන් නමුත්, කොන්ත්‍රාත් 17 න් 12 ක තොරතුරු පමණක් විගණනයට ඉදිරිපත් කල බැවින්, රු.4,610,680 ක් වටිනා කොන්ත්‍රාත්තු 05 ක් සම්බන්ධයෙන් විගණන පරීක්ෂාවක් සිදුකළ නොහැකි විය.

(ආ) තොරතුරු ලබාදුන් ප්‍රජාමූල සංවිධාන 12 න් 10 ක් විසින් ලංසු මිල ගණන් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘති 17 න් 08 ක් සඳහා කොන්ක්‍රීට් පරීක්ෂාව සඳහා ගෙවීම් සිදුකිරීමේ දී බිල්පතේ සඳහන් වටිනාකම පමණක් ගෙවිය යුතු වූවත්, ව්‍යාපෘති 02 ක් වෙනුවෙන් වූ රු.2,184 ක් වටිනා බිල්පත් සම්බන්ධයෙන් කාර්මික නිලධාරියාගේ නිර්දේශ යටතේ රු.73,500 ක් ගෙවා තිබුණි.

(ඇ) ඉහත සඳහන් මාර්ග වලින් UPS/DEV/UP-VIL/2015/01 හා UPS/DEV/UP-VIL/2015/16 යන ව්‍යාපෘති දෙක භෞතික පරීක්ෂාවේදී ප්‍රමාණපත් වලට අනුව පැවතිය යුතු නියමිත උස වූ අඟල් 12 නොපැවති අතර, එය අඟල් 2 ත් 3 ත් අතර ප්‍රමාණයකින් අඩුවෙන් පැවතුණි. එම නිසා මෙම මාර්ගයන් නියමිත ප්‍රමිතියට නොපැවැතිය ද කාර්මික නිලධාරියාගේ නිර්දේශය මත කොන්ත්‍රාත් 02 සඳහා අදාල මුළු වටිනාකම වූ රු.1,957,921 ක මුදලක් ගෙවීම් කර තිබුණි.

(ඉ) ඉහත ව්‍යාපෘතිවලට අදාල මාර්ග 04 ක් සම්බන්ධයෙන් ඉදිරිපත් කළ කොන්ක්‍රීට් තත්ත්ව පරීක්ෂණ, මාර්ග කොන්ක්‍රීට් කළ දිනට පෙර දිනයන් වලදී ලබාගත් කොන්ක්‍රීට් සාම්පලයන් යොදාගෙන කර තිබූ බැවින් එම වාර්තා නිවැරදි නොවීය.

(ඊ) UPS/DEV/UP-VIL/2015/18 ව්‍යාපෘතියේ කොන්ක්‍රීට් පරීක්ෂාව 2015 නොවැම්බර් 09 වන දින සිදු කර තිබූ නමුත්, ව්‍යාපෘතිය ආරම්භ කල දිනය 2015 නොවැම්බර් 14 දින විය. තවද ව්‍යාපෘතිය සඳහා මිල ගණන් ලැබීම 2015 නොවැම්බර් 19 වන දින හා ගිවිසුම්ගත දිනය 2015 නොවැම්බර් 24 දින විය. ඒ අනුව සභාව විසින් ලිපිගොනුව සඳහා ව්‍යාජ ලිපිලේඛන ඉදිරිපත් කර තිබුණි.

**3.3** වාහන පාලනය

---------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මුදල් අමාත්‍යාංශය, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය, නැගෙනහිර පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හ රාජ්‍ය නොවන සංවිධාන මඟින් සභාව වෙත ලැබුණු වාහන 20 ක අයිතිය පවරා ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. නියමිත කාලය තුල අයිතිය පවරා ගැනීම සිදු නොකිරීම නිසා වසරකට රු.730,000 කට ආසන්න දඩ මුදලක් මෙම වාහන වල අයිතිය පවරා ගැනීමේදී දැරීමට සිදුවිය හැකිය.

(ආ) සභාව සතු වාහන 08 ක් ධාවනය කල නොහැකි මට්ටමේ පවතින අතර, එම වාහන වලින් අළුත්වැඩියා කළ හැකි වාහන අලුත්වැඩියා කර පරිහරණයට ගැනීමට හා භාවිතයට ගත නොහැකි වාහන අපහරණය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාවේ හිටපු උප සභාපති විසින් 2014 පෙබරවාරි 28 දින සිට 2015 මැයි මස 11 දින දක්වා සභාවේ කැබ් රථය ඉන්ධන ලීටර් 1,711.75 ක් භාවිතා කර කිලෝමීටර 13,964 ක ප්‍රමාණයක් ගමන් බිමන් සඳහා භාවිතා කර තිබූ නමුත්, අදාල කාලය තුල ඔහු උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දිවිනැඟුම සංවර්ධන නිලධාරි ලෙස කටයුතු කර තිබූ බැවින්, මෙම කැබ් රථය නීත්‍යානුකුල නොවන පරිදි භාවිතා කර තිබුණි.

(ඈ) සභාවේ කැබ් රථය වගකිව යුතු නිලධාරියෙකුගේ අධීක්ෂණයකින් තොරව 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුල කිලෝමීටර 2,618 ක් ධාවනය කර තිබුණි.

(ඉ) කැබ් රථයකට අදාල 2014 මැයි 09 දින සිට 2014 ඔක්තොම්බර් 29 දක්වා හා 2015 ජුලි 15 සිට 2015 නොවැම්බර් 20 දක්වා දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) 2013 සැප්තැම්බර් 28 දින සිට 2014 මැයි 08 දක්වා කාල පරිච්ඡේදයට අදාල ධාවන අනුව කැබ් රථයක් ධාවනය කල මුළු කිලෝමීටර ගණන 9,585 කට සමානව වැය විය යුතු ඉන්ධන ප්‍රමාණය ලීටර් 1,198 ක් වූවත්, භාවිතා කර තිබූ ඉන්ධන ප්‍රමාණය ලීටර් 1,526 ක් වීමෙන් වර්තමාන මිල අනුව රු.31,160 ක් වටිනා ඉන්ධන ලීටර 328 ක් වැඩිපුර භාවිතා කර තිබුණි.

(උ) ධාවන තත්ත්වයේ පවතින වාහන 25 න් වාහන 02 ක් සඳහා පමණක් වාර්ෂික ආදායම් බලපත්‍ර ලබාගෙන තිබුණු අතර, ඉතිරි වාහන 23 සඳහා අදාල නිලධාරියා විසින් ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ඌ) ධාවන තත්ත්වයේ පවතින වාහන 25 න් වාහන 07 ක් සඳහා පමණක් රක්ෂණ සහතික ලබාගෙන තිබුණු අතර, ඉතිරි වාහන 18 සඳහා රක්ෂණ සහතික ලබාගෙන නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම සහ තථ්‍ය වියදම අතර සියයට 02 සිට සියයට 50 දක්වා පරාසයක විචලනයක් පැවැති බැවින්, අයවැය ලේඛනය සඵලදායි කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව සභාව විසින් 2016 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කල යුතුව ඇත.

| | පද්ධතිය | | අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රය |
|---|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | - | i. හිඟ ආදායම් අයකර ගැනීම.<br>ii. අතුරු ව්‍යවස්ථා පැනවීම.<br>iii. ආදායම් ප්‍රභව හඳුනාගැනීම. |
| (ආ) | අයවැය පාලනය | - | අයවැය නිසිලෙස පිළියෙල කිරීම. |
| (ඇ) | ගබඩා පරිපාලනය | - | ක්ෂණිකව හරි වැරදි බැලිය හැකි ආකාරයට භාණ්ඩ ගබඩා කිරීම. |
| (ඈ) | වත්කම් පාලනය | - | ස්ථාවර වත්කම්වල අයිතිය පවරා ගැනීම. |
| (ඉ) | ගිණුම්කරණය | - | වත්කම් ගිණුම්ගත කිරීම. |